# අතුරලිය ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගබඩා භාණ්ඩ හා ද්‍රව්‍ය ලැබීම් නිකුත් කිරීම් සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිතා කර වියදම් විශ්ලේෂණයක් මගින් අදාල වැය ශීර්ෂ වලට හර කිරීමක් සිදුව නොතිබූ අතර ලෙජරයේ ආරම්භක තොගයට ගැනුම් එකතු කර අවසන් තොග ගැලපුම් කිරීමෙන් පසු ලද වෙනස ආදායම් හා වියදම් ගිණුමේ වියදම් ලෙසට රු.1,814,499 ක මුදල ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙස පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) අතුරලිය දන්හේන මාර්ගය ඉදිකිරීම් ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.250,000 ක මුදල රු.25,000 ලෙසට ගිණුම්ගත වීම හේතුවෙන් රු.225,000 කින් ප්‍රාග්ධන ණයගැතියන් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද රු.10,700 ක් වටිනා මිළදී ගැනීම් ප්‍රාග්ධන වියදම් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2014 සැප්තැම්බර් මස 01 දින සභාවේ අංක PF 4507දරන කැබ් රථයේ ආසන කුෂන් කිරීම වෙනුවෙන් වැයකළ රු.177,900 ක වියදම ප්‍රාග්ධන වියදමක් ලෙසට ගිණුම්ගත නොකර පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිමේ වැඩ සටහන යටතේ නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,000,000 ක මුදලක් ලැබී පුනරාවර්තන ආදායමක් ලෙසට ගිණුම්ගත කර තිබූ අතර එකී මුදලින් ට්‍රැක්ටර් ට්‍රේලරයෙක් සඳහා රු.500,000 ක් වැය කිරීමට ඉලක්ක කර ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණද අදාල වැය ශීර්ෂ මාරුකිරීම් සිදුව නොතිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් තුනකට අදාල ශේෂයන්ගේ එකතුව මූල්‍ය ප්‍රකාශන අනුව රු.743,565 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව එය රු.725,809 ක් වූයෙන් වෙනස රු.17,756 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 පොලී අනුපාතය අතර වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කළයුතුය. එසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට එලෙස ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.223,023 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වූ අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,900 ක් විය.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.283,888 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.19,761,646 ක් වටිනා වත්කම්ද, රු.3,878,685 ක් වටිනා මුද්දර ගාස්තු සම්බන්ධයෙන් වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ විධිමත් උපලේඛන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) රීති 218 | සභාව ප්‍රයෝජනයට ගනු ලබන හා පදිංචියට ගනු ලබන සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,229,520 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.167,516 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු .000 |
| වරිපනම් හා බදු | 1,074 | 1,364 | 548 |
| කුලී | 2,488 | 2,131 | 118 |
| වෙනත් ආදායම් | 17,015 | 21,958 | 3,997 |

#### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ගාස්තු බිල් කිරීම් රු.665,764 ක් වූ අතර 2014 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.452,770 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ බිල්කිරීම් වලින් වර්ෂය තුල එකතු කරන ලද මුදල රු.310,673 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 46 ක් විය. 2014 ජනවාරි 01 දිනට හිඟ මුදලින් මේ වර්ෂය තුල ලද මුදල රු.287,744 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 63 ක් විය. මේ අනුව 2006 වර්ෂයේ සිට වාර්ෂික වරිපනම් බදු බිල් කිරීම් වලින් එම වර්ෂය තුල එකතු කර ගනු ලබන්නේ සියයට 50 ක් පමණ වූ ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය.

#### 2.2.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල් කිරීම් රු.12,307 ක් විය. 2014 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.35,154 ක් විය. 2014 වර්ෂයේ බිල් කිරීම් වලින් වර්ෂය තුල ලැබුණු මුදල රු.3,722 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 30 ක් විය. 2014 වර්ෂය ජනවාරි 01 දිනට හිඟ මුදලින් මේ වර්ෂයේ ලද මුදල රු.392 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 1 ක් තරම් සුළු අගයක් බවද නිරීක්ෂණය විය.

#### 2.2.4 බදු කුලී

සමාලෝචිත වර්ෂය තුල ගිවිසුම් පරිදි කඩකුලී නොගෙවූ කඩහිමියන් දස දෙනෙකුගෙන් රු.78,402 ක මුදලක් හිඟහිටව තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (අ) | උසාවි දඩ | 72,500 |
| (ආ) | මුද්දර ගාස්තු | 3,878,685 |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 ආදායම් කාර්ය සාධනය
----------------------------
2007 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ආදායමෙහි වැඩිවීම සියයට 72 ක් වුවද ඊට සාපේක්ෂව එම කාල පරාසය තුල වියදමේ වැඩිවීම සියයට 112 ක් විය. සභාව විසින් වාර්ෂිකව උත්පාදනය කරනු ලබන ආදායම සභාවේ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර පළාත් පාලන කොමසාරිස් විසින් එවනු ලබන ප්‍රතිපූර්ණයන් උපයෝගී කර ගෙන සභාව වියදම් පියවා ගෙන තිබුණි. ඉකුත් වසර 07 ක කාලය තුල නව ආදායම් මාර්ග උත්පාදනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

3.2.1 වීථි පහන් නඩත්තුව
----------------------
සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් උපකරණ මිලට ගැනීම සඳහා රු.81,677 ක මුදලක්ද වීථි පහන් නඩත්තුකරුට දීමනා සඳහා රු.60,000 ක්ද සමඟ එකතුව රු.141,677 ක මුදලක් වැයකර තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය සඳහා අනුමත වීථි පහන් සංඛ්‍යාව 57 ක් වුවද, වීථි පහන් නාම ලේඛනය අනුව බල ප්‍රදේශයේ වීථි පහන් 457 ක් නඩත්තු කර තිබුණි.

(ආ) වීථි පහන් නඩත්තු සඳහා 2012 වර්ෂයට පෙර රු.28,581 ක්ද, සමාලෝචිත වර්ෂයට රු.3,804 ක්ද, විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතුව තිබුණි.

(ඇ) විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 හා අංක පීඊ/01/01 දරන චක්‍රලේඛයේ 1.4 ඡේදය අනුව සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීමේ කටයුතු සිදුව නොතිබුණ අතර පහන් සවිකිරීමේදී වීථි පහන්වල විදුලි බල පාරිභෝජනය අදාල ප්‍රදේශයේ ගෘහස්ථ හා පොදු කාර්යය සිල්ලර පාරිභෝජනයෙන් සියයට 3 කට සීමාවිය යුතු වුවද සභාව මෙම වසරේදී ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පළකරවා ප්‍රසිද්ධ කළයුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සභාව විසින් ඉදිකරන ලද මංමාවත් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 01 | 01 | - | - |
| තෘතියික | 01 | 02 | - | 01 |
| ද්විතියික | 17 | 16 | 01 | |
| ප්‍රාථමික | 21 | 22 | - | 01 |
| වෙනත් | - | 03 | - | 03 |
| | 40 | 44 | 01 | 05 |

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.12,145,229 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා වෙනුවෙන් රු.14,419,134 ක් සභා අරමුදල් වැය කර තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලට රු.2,273,905 ක මුදලක් අතිරේක වැය බරක් වී තිබුණි.

(ආ) අනුමත නොවූ ආදේශක සෞඛ්‍ය කම්කරු තනතුරකට හා මුරකරු තනතුරු 2 ක් සඳහා සේවකයින් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,069,824 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවට වැඩ පරිපාලක තනතුරක් අනුමත වී නොතිබුණද 2008 මැයි මස සිට එම තනතුර සඳහා සේවකයෙකු බඳවාගෙන 2008 මැයි මස සිට 2014 දෙසැම්බර් මාසය දක්වා එකතුව රු1,855,837 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
---------------------
පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ගබඩා පරිපාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය